# විගමණික ශ්‍රමික
# බහුවිධ ණය යෝජනා ක්‍රමය




ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවන්හි නියුතු ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ ආර්ථික හා සමාජයීය තත්වයන් වැඩි දියුණු කිරීම සඳහා අඩු පොලී ප්‍රතිශතයක් යටතේ ණය මුදලක් ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එක්ව ගිවිසුම් ගතව ඇත.

## ණය ලබාගැනීම සඳහා නිර්දේශ කිරීමට පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය

- අයදුම්කරු විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය වලංගුව ඇති විදේශ රැකියාවක නිරත වන අයෙක් විය යුතුය.
- වසර එකකට නොඅඩු කාලයක් ඉදිරියට සේවා ගිවිසුම වලංගු විය යුතුය.
- වලංගු වීසා පතක් තිබිය යුතුය.
- නීත්‍යානුකූල මාර්ගයෙන් පෞද්ගලික හෝ බද්ධ විදේශ මුදල් ගිණුමකට මුදල් ප්‍රේෂණය කර තිබිය යුතුය.

නිර්දේශ කරනු ලබන ණය මුදල ගණනය කරනු ලබන්නේ විගමණික ශ්‍රමිකයා විසින් අවසන් මාස 03 තුලදී ප්‍රේෂණය කර ඇති මුදලෙහි සාමාන්‍ය අගයෙන් 60% ක මුදල මෙන් 36 ගුණයක් වන අතර උපරිම මුදල මිලියන 02කි.

මෙම මුදල වසර 03කට නොවැඩි කාලයකදී (උපරිම වාරික 36කි) වාර්ෂික පොලිය 8%ක් සමඟ ගෙවා අවසන් කල යුතුය.

## ණය යෝජනා ක්‍රමය යටතේ ණය අයදුම් කල හැකි බැංකු ආයතන

| | |
|---|---|
| 01. ලංකා බැංකුව | 011-2204871 |
| 02. මහජන බැංකුව | 011-3741288 |
| 03. කොමර්ෂල් බැංකුව | 011-2353840 |
| 04. හැටන් නැෂනල් බැංකුව | 011-2661381 |
| 05. කාර්ගිල්ස් බැංකුව | 011-7640461 |
| 06. DFCC බැංකුව | 011-2126835 |
| 07. සම්පත් බැංකුව | 011-2067817 |
| 08. සෙලාන් බැංකුව | 011-2456968 |
| 09. පෑන් ඒෂියා බැංකුව | 011-4667755 |
| 10. යුනියන් බැංකුව | 077-1354071 |

## නිර්දේශ ලිපිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි

- ඉල්ලීම් ලිපිය (ඉල්ලුම් කරනු ලබන ණය මුදල සහ අවශ්‍ය කාරණාව පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය)
- විගමණික ශ්‍රමිකයාගේ ගමන් බලපත්‍රය/ පිටපතක්
- විගමණික ශ්‍රමිකයාගේ ජාතික හැඳුනුම්පත/ පිටපතක්
- වලංගු සේවා ගිවිසුම (වසරකට නොඅඩු කාලයක් වලංගු විය යුතුය) / පිටපතක්
- වලංගු වීසාපත / පිටපතක්
- විදේශ මුදල් ගිණුමට අවසන් මාස 3තුලදී මුදල් ප්‍රේෂණ ලැබීම් පිලිබඳ බැංකුවෙන් සහතික කරන ලද පෝරමය

## පහත සඳහන් අවශ්‍යතා වෙනුවෙන් ණය පහසුකම ඉල්ලුම් කල හැකිය.

- නිවසක් ඉදි කිරීම / අලුත්වැඩියා කිරීම / මිලට ගැනීම
- ව්‍යාපාරයක් ආරම්භ කිරීම / වැඩිදියුණු කිරීම
- ඉඩමක් / වාහනයක් මිලට ගැනීම
- දරුවන්ගේ අධ්‍යාපන කටයුතු
- වෙනත් ඵලදායී කටයුත්තක්

**විගමණික ශ්‍රමිකයා වෙනුවෙන් වෙනත් අයෙකු ණය මුදල ඉල්ලුම් කරන්නේ නම්,**

- නම් කරනු ලබන තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත / පිටපතක්
- ඥාතීත්වය සනාථ කිරීම සඳහා විවාහ සහතිකය හෝ උප්පැන්න සහතිකය / පිටපතක්

ණය මුදල ඉල්ලුම් කරන කාරණාවට පමණක් මෙම මුදල් යෙදවිය යුතු අතර, ඒ පිළිබඳ විදේශ රැකියා සංවර්ධන නිලධාරීන් පසු විපරම් කරනු ඇත.

සුබසාධන අංශය
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
නො. 465, ගනහේන, බත්තරමුල්ල.

වැඩි විස්තර සඳහා
ඔබගේ විදේශ මුදල් ගිණුම ඇති
බැංකුව සමඟ සම්බන්ධ වන්න.

www.slbfe.lk